# පිටියේ දෙවියන්ගේ සම්භවය හා තදනුබද්ධ ජනශ්‍රැතියෙන් බිඳක් ...

වයි.කේ. තිස්ස බණ්ඩාර

පිටියේ දේව සංකල්පය සම්බන්ධයෙන් විවිධ කථා ප්‍රවෘත්ති මහනුවර ආශ්‍රිතව ව්‍යවහාරයේ පවතී. ඇතැම් ඒවා කථා මාධ්‍යයෙන් ද ඇතැම් ඒවා ලිඛිත මාධ්‍යයෙන් ද හමු වේ. ලිඛිත සහ ජනශ්‍රැතියේ එන මේ සම්බන්ධ පුවත් සමාන අසමානතාවලින් ද යුක්ත වේ. පිටියේ දෙවියන්ගේ පහළවීම සහ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පවතින කථා බොහොමයක මූලික තේමාව බොහෝ දුරට සමාන වේ. පූජ්‍ය ගුන්නෑපාන වජිරඤාණ හිමියෝ එත්කරා පිටියේ දේවාලයක් ආශ්‍රයෙන් දිගු විස්තරයක් සපයති. එය මෙසේ ය.

"පාතදුම්බර දෙගල්දොරුව විහාරයට බටහිරින් පිහිටි දේවාලයේ වැඩසිටින පිටියේ දෙවියන් පිළිබඳව මහජනයා අතර පැතිර පවත්නා කථා රාශියෙකි. එයින් නාථ දෙවියන් හා පිටියේ දෙවියනුත් අතර ඇති වී යයි කියන භයානක යුද්ධයක තොරතුරු දැක්වෙන ජනප්‍රවාදය ඉතා වැදගත් ය. අවියෙන් අවිය ගටා කෙරුණු මේ සටන දුටුගැමුණු එළාර යුද්ධය සිහිපත් කරවන්නකි. දුටුගැමුණු එළාර යුද්ධයේ දී දෙපක්ෂයට ම මිනිසුන්ගේ සහාය ලැබුණු නමුදු මේ යුද්ධයේ දී ඔවුනට සහායට පැමිණියේ යක්කු ය. පිටියේ දෙවි වූ කලී සොළී රජකුට දාවැ 'සපුලී' නම් කුමරියක කුස උපන් පුත්‍රයෙකි. කුඩා අවදියෙහි සිට නොහික්මුණු තැනැත්තෙකු වූ ඔහු දිනක් රථයකින් උයනට යද්දී වසු පැටියෙක් රථයේ රෝදයට අසු වී මරණයට පත් විය.

දැන හෝ නොදැන කළ මේ වරදට රජකුමරුට වුව ද දඬුවම් කළ යුතු යැයි මහජනයා කියා සිටි නිසා වරදකරුවකු දඬුවමින් නොමිදිය හැකි යැයි සිතූ පිය රජ තෙමේ ඔහු ජීවග්‍රාහයෙන් අල්වා ඒ කරත්ත රෝදයට ම යට කර මැරීමට නියම කළේ ය. රාජ නියමය පරිදි කුමාරයා මරුමුවට පත් කරවන ලදි.

දඬුවම් දීමේ දී වරද සොයා බලා එය සිදු කළ ආකාරයෙන් ම දඬුවම් පැමිණවීම එකල සොළී රටේ පැවති සිරිත විය. ඈත අතීතයේ සිට ම බොහෝ රටවල පැවති මේ සිරිත නිසා අපරාධ කිරීමට රටවාසීහු බිය වූහ. අපරාධ නැති කිරීමේ මූලික හේතුවක් වශයෙන් පැවති මේ සිරිත නිසා රටවාසීහු මහත් සේ විනය ගරුක විය.

කරත්ත රෝදයකට යටකර මැරූ කුමාරයා රටවැසියා බලාපොරොත්තු නොවූ යකෙක් වී ඉපදුනේ ය. මේ යක්ෂ තෙමේ සිය පුරවැසියා පෙළීමේ අදහසින් තොරව දේශාටනයෙහි යෙදීමට සිතා 1029 දී රජ පැමිණි (කාශ්‍යප) වික්‍රමබාහු රජු දවස ලක්දිව මඩකලපු ප්‍රදේශයට ගොඩබැස එහි ටික කලක් නැවතී ස්ථිර වාසයට තැනක් සොයමින් හුන්නස්ගිරි ශිඛරය කරා පැමිණියේ ය. මේ අවදියේ දුම්බර මිටියාවත පිළිබඳ සෑම බිම් අගලක් ම නාථදෙවියන්ගේ අණ සක යටතේ පැවති නිසා යක්ෂ තෙමේ තමාටත් විසීමට සුදුසු තැනක් ලබා දෙන ලෙස දෙවිඳුන්ගෙන් අයැද සිටියේ ය. එහෙත් ඔහුට නැවතීමට තබා කථා කිරීමට තරම්වත් අවසරයක් නාථ දෙවියන්ගෙන් නොලැබිණි. ඔහු නැවත නැවතත් මේ ගැන පෙරැත්ත කරමින් ගම්වරක්වත් දෙන ලෙස ඉල්ලීය. නාථ දෙවියන්ගෙන් ඊට ද පිළිතුරක් නොලද යක්ෂ තෙමේ පියවරක් තරම් ඉඩක් වත් දෙන ලෙස යාඥා කළේ ය. ඔහුගේ අන්තිම ඉල්ලීමට පවා නාථ දෙවියන් ඇහුම්කන් නොදුන් නිසා යුද්ධ කළ යුතු යැයි තීරණය කොට දූතයෙකුගේ මාර්ග යෙන් ඒ බව දෙවිඳුන්ට දන්වා හැරියේ ය.

මේ අවදියේ දී යක්ෂයා තාවකාලික වශයෙන් නැවතී සිටියේ හිස් පිටියක ය. ඒ නිසා දුම්බර වැසියෝ 'පිටියේ දෙවි' යන



නමින් යක්ෂයා හඳුන්වන්නට පටන් ගත් හ. මෙකල දුම්බර සිටි රදල පක්ෂයේ කීප දෙනෙක් ද මරා යක් බවට පත් කරගත් මෙම යක්ෂයා යුද්ධය සඳහා ඔවුන්ගේ ද සහය බලාපොරොත්තු විය. මෙහි දී නිකම් බලා නොසිටි නාථ දෙවියෝ ආයුධ සන්නද්ධ වැ බිම්බර හයක් පමණ යක්ෂ සේනාවක් රැස් කොට පඤ්ච තූර්‍යනාදයෙන් යුද්ධ භූමිය වෙත පැමිණියෝ දුම්බර මිටියාවත අමු සොහොනක් හෝ අභය භූමියක් හෝ බවට පත්කරවන්නේ මැයි මහ හඬින් ගුගුළහ. එහෙත් තමා බෝධිසත්ව වරයෙකු වූ හෙයින් හැම යුද්ධෝපක්‍රමයක් ම අවිහිංසාවට මුල් තැන දී යෙදිය යුතු විය. අවාසනාවකට මෙන් ඔහුගේ යක්ෂ සේනාංකය ද පිටියේ දෙවියන්ට එක් වීම නිසා සිදු වූයේ නායකයන් දෙදෙනාට පමණක් තනි ව සටන් කිරීමට ය. ඔවුනොවුන් අභිමුඛයෙහි අවියෙන් අවිය ගටා කෙරුණු මේ ද්වන්ද්ව යුද්ධයේ දී පැරදුණු නාථ දෙවියෝ 'පස්ගම' දක්වා පසුබැස්සා හ. දැනුදු නාථ දෙවියන් 'පස්ගම' නැවතී සිටිතැයි පවසති. නාථ දෙවියන්ගේ පරාජය පිළිබඳව දුම්බර වැසියෝ නොයෙක් දුඃඛාලාපයන් කියමින් ශෝක කළහ. පාත දුම්බර ගෝණාවත්තේ දී කෙරුණු මේ යුද්ධය ගැන දුම්බර වැසියන් තුළ පහළ වූ හැඟීම් පැවසෙන ගද්‍ය පද්‍ය නිබන්ධ රාශියක් ම දක්නට ලැබේ. ශෝකය හා අනුකම්පාවත් දනවන සුලු ඒ නිබන්ධ පැරණි සිංහල ජන කවිවලට බෙහෙවින් සමාන ය. පහත දැක්වෙන පද්‍ය ඊට හොඳ නිදසුනකි.

ඈත කපට බුදු වෙන්ව පතන වා  
නාත දෙවිඳු යුදයෙන් පරදින වා  
දෑත දෙපය කිංකිණි නද දෙන වා  
නාත දෙවිඳු දුම්බර හැර යන වා

පිටියේ දෙවියන්ගේ පක්ෂය ගත් යක්ෂයන් ලවා එක් රැයක දී ගුරුදෙණියේ ගල තිස් රියන් කප්පවා යකුන්ගේ හපන්කම් පෙන් වූ අයුරු එහි වැසියන් පවසන්නේ මහත් අභිරුචියකිනි. දැනට කඩවර ගොටු පුදන්නේ මේ ගල ළඟ ය. කඩවරයා ද යකුන් අතර මහා බලවතකු හැටියට ප්‍රසිද්ධ ය. මලය රජුගේ ප්‍රධානත්වයෙන්

පැවැත් වූ හැටහත් කට්ටුවේ දේවසමාගමට සහභාගි වීමට යන අතර මගදී ඇති වූ සුළු ප්‍රමාද දෝෂයක් නිසා නියම වෙලාවට සමාජ ශාලාවට පිවිස ගත නොහැකි වූ කඩවරයා එහි රැස්ව සිටි දෙවිවරුන් පන්නා දැමී ය. දේවසමාගම අවසානයේ පැවැත් වූ භෝජන සංග්‍රහයේ දී කඩවරයාගේ කෑම බීම කොටස ඈතින් තැබීමට ද නියම විය. එදා සිට කඩවර ගොටුව දුරින් තබන බව ප්‍රසිද්ධ ය. පහත දැක්වෙන කවියෙන් එය පැහැදිලි වෙයි.

මලය රජුගේ නුවරට වුණු කාරිය
එන්ට බැරිව මග පසු වුණු කාරිය
ඒ උදහස තවමත් අත නෑරිය
දුරින් තබව යක් කඩවර කාරිය

මේ කථා ප්‍රවෘත්තියට සත්‍යයේ ආශිර්වාදය ලැබෙතොත් යකුන් පිළිබඳ මෙසේ පවත්නා විවිධ හැඟීම් හා පුද පූජා මතිමාත්‍ර නොවන බව පිළිගත හැකි ය.[1]

කොටගම වාචිස්සර හිමියෝ පිටියේ දෙවියන් ගැන මෙසේ සඳහන් කරති. "සිංහලයන් විශ්වාස කරන නමුත් ඔහු සොළී රටින් පැමිණියෙකු බව 'පිටියේ සුරිඳු පුවත' නම් කාව්‍යයෙන් පැහැදිලි වෙයි. 'පිටියේ බණ්ඩර විත්තියෙ' හි දැක්වෙන,

සොළී රට යැයි ය න
දෙසෙන් නිරිඳෙක් සපැමි ණ
සඳ රජකම් කර න
ඔහුට කුමරෙක් මෙලෙස ඇති වූ න

යනා දී කවිවලින් විස්තර වන අයුරු නම්, සොළී රටින් මෙහි පැමිණ රජ වූ එළාරගේ පුත්‍රයා මොහු ය. නොසැලකිල්ලේන් රිය පදවා වසුපැටවකු මැරීම නිසා මොහු විසින් මරන ලද පුත් කුමාරයා යකෙකු වී ඉපදුණු බවත් ඔහු පසුව පිටියේ සුරිඳු වූ සැටින් මෙ කවි පෙළින් හෙළි වෙයි.



ලක්දිවට පැමිණි ද්‍රවිඩයන් විසින් මෙරටට ගෙන ආ පිටියේ දෙවිඳුන්ට දුම්බර දේවාලයක් ඉදිකොට ඇත. එහි දී මේ දෙවියා විසින් නාථ සුරිඳු පරදවා ජයගත් සැටිත්, ගුරුදෙණියෙහි ඇළක් කැපීමට බාධකව පැවති පර්වතයක් බිඳීම නිසා සෙංකඩගල විකුම්බා රජු මොහු කෙරෙහි පැහැදුණු සැටිත් එම කාව්‍යයෙහි විස්තර කොට ඇත.

මිනිසුන් සහ ස්ත්‍රීන් යක්ෂයන් කිරීමට තරම් බලයක් ඇතැයි සැලකෙන මොහු ගුණ ගයනු සඳහාය වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ ආරාධනයෙන් දොඩම්වල කිවිඳු විසින් යට කී කාව්‍යය රචනා කරන ලද්දේ. **වීරවංස පිටියේ දෙවි, සොළීකුමාර පිටියේ දෙවි** ආදී අපර නාමයන්ගෙන් ද හැඳින්වෙන මේ දෙවියා කන්ද උඩරට මිනිසුන්ගේ බලවත් පුද සැලකිලිවලට භාජන වූවෙකි" [2]

මහාචාර්ය **විමලානන්ද තෙන්නකෝන්** පිටියේ දෙවියන් පිළිබඳ මෙසේ දක්වයි. "පිටියේ දෙවියන් සඳහා පුද පූජා පැවැත්වෙන දේවාල මෙනම්. පිටියේ දෙවියන් අප රටට පැමිණීම පිළිබඳ පුවත මෙසේය. සොළී රටේ සොළොසැවිරිදි රජ කුමරෙක් කාලක්‍රියා කොට දේව යෝනියෙහි ඉපද යක් සෙන් පිරිවරා අහසින් යන්නේ දුම්බර පෙදෙස කෙරෙහි සිත බැඳී හුන්නස්ගිරි කන්දේ වාඩි ලා ගත්තේ ය. එකල හුන්නස් ගිරි කන්ද වටා හැම තැන ම පිටි හෙවත් පිට්ටනි තිබුණේය. මොහු පැමිණීමෙන් පසු තුන් සමයම් වේලාවක හුන්නස් ගිරිය අසල පිට්ටනියකට ගිය යම් කිසිවෙක් වූහු නම් ඔවුනට ජ්වර රෝගය වැළඳුණි. මෙය අලුත් දෙවියන්ගේ තෙද බල නිසා වී යයි සිතා ඔහුට භාරහාර වීමෙන් රෝගීහු සුවය ලැබූ හ. මේ දෙවියන් නිතර පිටිවල සැරිසරන හෙයින් පිටියේ දෙවියෝ යන නාමය ඔහුට පටබැඳුණි.

පිටියේ දෙවියන් එන විට දුම්බරට අරක් ගෙන එහි වැසියන්ගෙන් පුද සිරි ලබමින් සිටියේ නාථ දිව්‍ය රාජයා යි. අලුත් දෙවියන්ගේ පැමිණීමෙන් පසු නාථ දෙවියන්ගේ භාස්කම්

මුල්ලට තල්ලු වුණි. ඔහු වෙත පුද පඬුරු පැමිණියේ ද නො වේ. මිනිස්සු ඔහු නොසලකා හැරියෝය. මේ නිසා නාථ දෙවියන්, පිටියේ දෙවියන් පලවා හැරීමට අදහස් කෙළෙන් දෙපක්ෂය අතර යුද්ධයක් සිදු විය. මේ අවිගැටුම සිදු වූයේ දුම්බර යක්ග හපිටිය නම් ස්ථානයේ දී ය. නාථ දෙවියන් තෙරුවන් සරණ ගිය, ප්‍රාණ ඝාතයෙන් වැළකුණු තැනැත්තෙකු බව දත් පිටියේ දෙවියෝ ඇත්, කොටි, වග, වලස් ආදී සතුන් දෙපලු කරමින් නාථ දෙවිඳුන්ට දමා ගසන්නට පටන් ගත්තේ ය. මේ දුටු නාථ දෙවිඳු තැති ගෙන මහවැලි ගඟෙන් එගොඩට පලා ගොස් මහනුවර අසල කන්දක් තම විමානය කර ගත්තේ ය.

මෙයින් පසු පිටියේ දෙවියන්ගේ තෙද බල මහිම රට හැම තැන ප්‍රසිද්ධ විය. තන්හි තන්හි ඔහුට කැප කරන ලද දෙවොල් ඉදි විය. **වික්‍රමබාහු, සෙනරත්, රාජසිංහ, වීරපරාක්‍රමබාහු නරේන්ද්‍රසිංහ, ශ්‍රී විජය රාජසිංහ** ආදී රජවරු ද ඔහුට භාරහාර වී පුද පූජා පැවැත්වූ හ. ගුරුදෙණියේ කෙත් යායට ජලය ලබා ගැනීම සඳහා කැපූ ඇල හරහට පිහිටා තිබුණු ගල කඩා ගත නොහැකි වූ වික්‍රමබාහු රජතුමා පිටියේ දෙවියන්ට බාරයක් වූයේ මේ නිසා ය. පුදුමයකි. පසු දින ඇල දිගට ම ගල කැඩී, ඇල සෑදී තිබුණි. මෙයින් සතුටට පත් රජතුමා ගුරුදෙණියේ දේවාලයක් ඉදි කොට එය පිටියේ දෙවියන්ට කැප කළේය. යටකී කාර්යය පිටියේ දෙවියන් වේ ඊණින් ගල කැඩීම යයි ප්‍රසිද්ධ ය. මේ ඇලත් දේවාලයත් මහනුවර-හඟුරන්කෙත මහා මාර්ගයේ සතරවැනි සැතපුම් කණුව අසල ගුරුදෙණියේ පිහිටියේ ය" [3]

නාවුල්ලේ ධම්මානන්ද හිමියෝ පිටියේ සහ නාථ දෙවියෝ පිළිබඳව මෙසේ දක්වති "නාථ දෙවියන් පරදවා ජයගත් පිටියේ දෙවියෝ ස්වීය වික්‍රමාතිශය මුළු දුම්බර වැසියන් කෙරෙහි පමණක් නොව **වික්‍රමබාහු සේනාරත්න - රාජසිංහ - වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ** ආදී නරේන්ද්‍රයන් කෙරෙහි බල පවත්වන්නට පටන් ගත් හ. එහෙයින් ඒ සියල්ලෝ ද ඔහු කෙරෙහි ගැති වූහ. ඔහුගේ ම පිහිට සොයන්නට වූහ. ගුරුදෙණියේ කෙතට



ජලය ලබා ගැනීම සඳහා කැපූ ඇලේ හරහට පිහිට තිබූ ගල කඩා ගත් නොහැකි වූ **වික්‍රමබාහු** රජතුමෝ ද පිටියේ දෙවියන්ට භාරයක් විය. පුදුමයකි පසුදින උදේ බලන විට ගල සුණු විසුණු කොට තිබෙනු දක්නට ලැබිණ. එයින් පහන් වූ රජ තෙමේ ගුරුදෙණියෙහි දෙවොලක් ඉදිකොට පිටියේ දෙයියන්ට කැප කළේ ය.

පිටියේ දෙයියන් කැඩූ ගල හා නරදෙයියන් කැපූ ඇලත් සැදවූ දෙවොලත් **මහනුවර-හඟුරන්කෙත** මහා මාර්ගයේ සතරවැනි සැතපුම් ටැඹ සමීපයෙහි පිහිටි ගුරුදෙණිය නම් ගමෙහිදී අදද ඔබට බැලිය හැකිව තිබේ.

'අමුණුගම - පිලවල ආදී ගම්වල පිහිටි දේවාලයෝ ද මේ රජතුමන් විසින් ම කරවන ලද්දෝය' යි කියති" [4]

සිංහල දේවපුරාණයේ මෙම දෙවියන් පිළිබඳව මතු දැක්වෙන විස්තර සඳහන් ය. " සෙංකඩගල යුගයේ දී දුම්බර ප්‍රදේශයෙහි ඉතා බලවත් දෙවියො ලෙස නැගී ආයේ පිටියේ දෙවි ය. මෙම දෙවි කවරෙක් ද යන්න ගැන විවිධ මත ඇත.

01. සොළී රටේ රජකුට දාව උපන් මේ කුමරා තම රියට අසුකර වසු පැටවකු මැරූ හෙයින් එයට දඬුවම් වශයෙන් එම රියට ම යට කොට මරණ ලදුව යක් බවට පත් විය. මේ පුවත එළාර රජු ගේ පුතෙක් යැයි ද විශ්වාසයක් පවතී.

02. කාවේරි පුර විසූ සොළී නම් රජුගේ අග බිසවට උපන් මේ කුමාරයා නැකැත් ඇදුරන් කී අනාවැකිය අනුව සොළොස් හැවිරිදි වියේ දී දුම්බරට පැමිණ එහි සිටි නාථ දෙවියන් පලවා හැර එම පෙදෙසට අධිපති විය. මෙතෙම සොළී කුමාරයෙකි යන්න වඩා ම ප්‍රකට විශ්වාසයකි.

03. ගජබා රජ දවස සොළී රටින් ගෙනා දොළොස් දහසක් සොළීන්ගේ නායකයා ය. දුම්බර මිටියාවතේ සංවර්ධන

කටයුතු භාරව සිටි මොහු ගබඩාගම් විස්සක්, බැද්දේගම් නවයක් හා පත්තගම් කුල හතරක් ද සංවර්ධනය කර ඇතැයි යනාදිත්තක සඳහන් වේ.

04. සිකුරුගේ කුණ්ඩලාහරණ දේව යුද්ධයක ප්‍රතිඵලයක් වශයෙන් මහ පොළොවේ ශ්‍රී ලංකාවේ තැනකට වැටෙන බව දැන මෙහි පැමිණි භාරතීය බ්‍රාහ්මණයෙක් එය ලබා ගත නොහී එම සොවින් මහවැලි ගගේ ගිලී මිය ගොස් දේවත්වයට පත් විය.

05. දුටුගැමුණු රජුගේ ගොඨයිම්බර යෝධයා, මිය ගිය පසු දේවත්වයට පත් වී පිටියේ දෙවි වූයේ ය.

සෙංකඩගල විසූහයි සැලකෙන සඳ මහරජ ගුරුදෙණියේ කෙතක් කරන්නට වෑයම් කළත් එහි වූ ගලක් නිසා එම වෑයම ව්‍යර්ථ විය. ඉන් සෙංකඩගල රජ පැමිණි වික්‍රමබාහු රජු ද එම ගල කැඩීමට වෑයම්කොට එය ව්‍යර්ථ වී සිටිනා සඳ සිහිනෙන් පෙනී සිටි පිටියේ දෙවියෝ තමන්ට රන් කඩුවක් සාදා දුන්නොත් ගල කඩා දෙන බව කීහ. රජ රන් කඩුව සාදා දුන්නෙන් පිටියේ දෙවියෝ සිය යක්ෂ සේනාව මෙහෙයවා ගල කඩා දුන් හ. ඉන් පසුව වී කොටා බත උයා ගෝනකු මරා මස් ද සහිතව දෙවි පුද පවත්වන ලදි. ගෝනා මැරූ තැන ගෝනාවත්ත විය.

මින් කලකට පසු සෙනරත් රාජ සමයේ දී රජුට ගඟේ එගොඩ සිට මෙගොඩට කිරි ගෙන යන සෙබළාගේ ඔරුව ගඟ පහළට පාවී ගොස් තිබුණු කල්හි දෙවියන් යැදීමෙන් ඔරුව උඩු ගං බලා ඔහු වෙතට ආයේ ය. රාජසිංහ රජ දවස නාතුමුර කරන ගංතොටේ පැවැති ගිරි කුළක් ඉවත් කරන්නට අවශ්‍ය වී මෙය කරන්නට පිටියේ දෙවියන් මිස අන් සමතෙක් නැතැයි රජු කියා ආපසු ගිය බවත් පසුව දා වන විට එකී ගිරි කුළ අසල වූ ගලක් මුදුනේ තබා තිබූ බවක් කියැ වේ. (එම). නරේන්ද්‍රසිංහ රජුගේ ඇස් රෝගයක් පිටියේ දෙවියන් සුව කළ හෙයින් දම්බරාවේ පිටියේ දේවාලය කරවන ලදැයි විශ්වාසයක් පවතී. ඇස් රෝගය



සුව වී මේ දේවාලය කරන ලද්දේ දෙවන විවමලධර්මසූර්ය රජු විසිනැයි තවත් විශ්වාසයක් ඇත.

ඉංග්‍රීසි පාලන සමයේ සිදු වී යැයි සැලකෙන ප්‍රාතිහාර්යයන් ගැන ද ජනප්‍රවාද පවතී. මහවැලි ගඟ අද්දර කැළේ දේවාලය පිහිටි තැන මාබේරි වතු යායට ඈදා ගන්නට අදහස් කළ ඉංග්‍රීසි වතු පාලකයන් දේවාලය අවට කැලෑව එළි පෙහෙළි කරවන්නට ඇරඹි විගස දෙබරුන් හා නයින්ගෙන් උපද්‍රව පැමිණියෙන් කම්කරුවන් බිය පත් වූ හෙයින් එය නවතා දමන්නට සිදු වූ බවත් ලෙන තුළ වූ දේවාලය අන් තැනකට ගෙන යාමට සූදානම් කළ කපුරාල ඒ සඳහා ලී දඬු සම්පාදනය කොට රාත්‍රී නින්දට ගිය කල සිහිනෙන් පෙනී සිටි කෙනෙකු එය නොකරන ලෙස පැවසූ බවත් පසු දා වන විට ඔහු එකතු කළ ලී දඬු ගඟේ පාවෙමින් තිබුණු දක්නට ලැබුණු බවත් ඉන් පසු පැරැණි දේවාලයේ ම තේවාව පවත්වාගෙන ගිය බවත් කියනු ලැබේ.

ලක්දිවට පැමිණි පිටියේ දෙවියන් විසින් 'යක් කර ගත් ' අයගේ නම් දෙවියන්ගේ කවිවල සඳහන් ය.

| | |
|---|---|
| දෙවිඳුන් පිවිතුරු පල්ලේ | බැද්දේ |
| පිවිතුරු බණ්ඩාර ද | වෙල්ලස්සේ |
| යක් කර ගත් අබකොන් | මැතිඳුන් |
| රාළ භාරගම සෙත් සිරි | දෙවිඳු |
| පසන් ගිරාගම එතනින් | සාමින් |
| කටුගම්පොළ රාළත් | සුපසන්නේ |
| පායින්ගමුවෙහි සී | බණ්ඩාරත් |
| මනනඳ කඩුවෙල රාළ ද සොඳි | තේ |
| රුදුරු තෙදැති දැඩි අප්පුද | සිරිමත් |
| සොඳුරු රුවැති කළු අප්පුද | අගපත් |
| සසිරු රෝග නෙක උවදුරු | අසමත් |
| අඳුරු දුරල රවි මෙන් ලෙඩ | දුරලත් |

වීර විකුම් ඇති කළු     නයිදේ යා
සාර රුවන් තන්තිල     නයි දේ යා
දීර පහඟ ගම්මන     නයි දේ යා
නෑර සතුන් රැක සෙත්     සිරි දේ යා

සුවිපුල් තෙද ඇති කුමරා     සාමින්
මනකල් රුසිරු තිබූ මුතු     සාමින්
පිළිමල් දප හළ බිළිඳු එ     සාමින්
හැම කල් සත රැක පුලියා     සාමින්

මෙලෙසින් යක් සෙන් පිරිවර     රැගෙනා
සුපසන් පිටියේ සුරනිඳු     නිති නා
රකිමින් සව් සත වෙත කර     කරු නා
මෙලෙසින් වැජඹෙයි පුරඳුරු     සිරි නා

පිටියේ දෙවියන්ගේ වික්‍රම අතර ඉතා ප්‍රකට සිද්ධිය වන්නේ නාථ දෙවියන් හා යුදකොට දුම්බර තමා අත්පත් කර ගැනීමයි. මේ පුවත ඉහත නාථ දෙවියන් පිළිබඳ විස්තරයේ ඇතුළත් කර ඇත.

"පිටියේ දෙවියෝ ගොවි ජනතාවට විශේෂ වූ දෙවි කෙනෙකි. ගල බිඳ කෙත සාදා දීම නිසා ප්‍රථමයෙන් ජනාදරයට පාත්‍ර වූ මෙම දෙවියෝ නිසි කලට වැස්සත් ඉඩෝරයත් සලසා ලමින් ගොවි ජනයාට සෙත සලසති. එහෙයින් පිටියේ දේවාල වෙල්යාය අසල පිහිටුවීම නිතර දක්නා ලැබේ. මුල් යුගයේ මේ දේවාලවල විශේෂත්වයක් වූයේ වහලකින් තොරව නිර්මාණය වී තිබීම බව පෙනේ. තෙල්දෙණියේ ඉඩම් ගලේ පැරැණි පිටියෙ දේවාලය මෙබඳු විය. තවත් ප්‍රකට පිටියේ දේවාල ගුරුදෙණියේ, හාරගම, දම්බරාව, හුරීකඩුව, දෙගල්දොරුව, වටපුළුව, හපුගොඩ, ද පිහිටා ඇත. පිටියේ දෙවියන් හා සම්බන්ධ පුරාණයේ පැවති දේවාල දැන් අභාවයට ගොස් ඇත"[5]



දැනට ආසන්න වශයෙන් වසර 190ට පෙර ඩේවි, පිටියේ දෙවියන්ගේ වර්ණ දක්වා තිබේ. ඒ මෙසේ ය. "විෂ්ණු නිල් පාටය, නාථ හා සමන් සුදු පාටය, පත්තිනි කහපාටය, පිටියේ හා කතරගම රතුපාට ය" [6]

පිටියේ දෙවි "භූතයෙකි යැයි" ඩී. පී. වික්‍රමසිංහ මෙසේ සඳහන් කරයි. "දුම්බර මිටියාවතේ මහවැලි ගඟ අසළ ප්‍රදේශයට අධිගෘහිතව ඒ ප්‍රදේශයේ පුද පූජා ලබන "පිටියේ දෙයියෝ" නමැති භූතයෙකු පිළිබඳ විශ්වාසයක් ඒ ප්‍රදේශවාසීන් අතර පවතී. පිටියේ දෙවියෝ නම් අනෙකෙකු නොව ගෝඨයිම්බර යෝධයාගේ මරණින් පසු ජනිත වූ "අවතරය" යයි සමහරුන්ගේ මතය නම් ඉන්දියාවෙන් මෙහි පැමිණි වීරක්‍රියා කළ ද්‍රවිඩ මනුෂ්‍යයෙකු මරණින් පසු පිටියේ දෙවි නමින් උපන් බව යි" [7]

පිටියේ දෙවියන් පිළිබඳ ව පුරාණ පුස්කොළ පොත්හි තිබී දොළහ දෙවියන්ගේ කවි යටතේ පළ වී තිබෙන දීර්ඝ පද්‍ය පෙළකින් තෝරාගත් කවි කීපයක් පහත දැක්වේ.

දුම්බරට වැඩ     ලා
දුම්බර එළිය දැක     ලා
සාම සැර ඇර     ලා
නාථ දෙවියන් මෙගොඩ කර     ලා

නරන් රකිමින්     නේ
එරන් රතයෙන් එන්     නේ
අරන් දෙවියන්     නේ
වරන් පිටියේ සුරිඳු එන්     නේ

සොළී රටේ පියමහ රජු නම්     නා
හලීයපුලි කුමරිගෙ කුස උප     නා
පිළි සරන මන්ගල්ලෙට යෙදෙ     නා
සොළී කුමරාහට දළුමුර මෙත     නා

සොළීපුර සිංහ නරනිඳු පෙල වත් තු
මැලීනොව කුමරෙක් උපනි මහත් තු
එලිබැස රනකෙලියට අදිපත් තු
දැලේ පිරිවර සෙනග වියත් තු

රතයට පැන නැගෙමින් සොලි කුම රු
ගත පිටරන් රඹ පැලමෙන් රුසි රු
එතනම කලකම් පලදුනි නපු රු
සිතසතොසින් නමදින් සොළී කුම රු [8]

තව ද කෝල්මුර කව්පෙළක පිටියේ දෙවියන් ගැන මෙසේ දැක් වේ.

පිටියේ දෙවියන්නේ
නාමය මම කියන්නේ
වරද නොසිතන්නේ
ඇත්තෝ වරදක් සමා වන්නේ

සත් හැවිරිදි වයස
වූ කල කුමරු වී යස
රතයක් සාදා තොස
ගියේ සෙල්ලම් ගමන් මේ ලෙස

සොළී රට යයි යන
දෙසන් තිරි දෙක් සපැමිණි
සඳ රජකම් කරන
ඔහුට කුමරෙක් මේ ලෙෂ ඇති උණ

සතොස සෙල්ලම් ගිය ගමනේ දින්
රහු මිණි බැඳ රතය ද තද වේගෙන්
පහු මග නොබලා එ කුමරු යද්දින්
අහු උනි වහු පැටියෙක් පිටියේ දින්



කැටුවා ගිය මැති රජරට කීවයි
පැටවා මැරුවේ ඔබ ගෙ කුමරුමයි
දුටුවා කී සින්දා අණ ලූවයි
හිටුවා පස් ගසලා වැනසූවයි

කුමරු කුරිරු සිත රජුට උපන්නේ
රුහිරු රජු ගෙ බිඳ බොන විලසින්නේ
නපුරු සිතේ පිට රජුට තියෙන්නේ
කුරිරු කමින් යකු වෙලා උපන්නේ

බූත යකුට තෙද බල දෙවියන්නේ
නාත දෙවිඳු හට බල පෙන්වන්නේ
මැත මෙ ගන්තෙර නො සිට කියන්නේ
නාත දෙවියො එ ගොඩට පන්නන්නේ

නන්දැරු පරසිඳු ඒ තෙද බණ්ඩර
දුම්බර පෙදෙසේ බිඳ ගල සුන් කර
ගම්බිර සේ ගල පිට කෝවිල් කර
දුම්බර අදිපති පිටියේ බණ්ඩර [9]

දුම්බර ජනකථා අතරේ පිටියේ දෙවියන් ගැන මෙසේ දැක්වෙයි. " නාථ දෙවියෝ මෙහෙ හිටියෙ පිටියේ දෙවියෝ එන්න ඉස්සර. නාථ දෙවියෝ පව්වලට බයයි. එළාර රජ්ජුරුවෝ සොළී කුමරු දඬුවම් ලෙසින් කරත්තයට අහුකර මරා දැම්මා. පස්සේ ඔහු බූමාටු දෙවියෝ උනා. ඔහු මෙහි රඹුක්වැල්ලේ පිටිය තිබුණ ස්ථානයට ආවා. නාථ දෙවියෝ හැඩි දැඩි නැති නිසා ඌරෙක් මරාගෙන ගාත් වලින් නාථ දෙවියන්ට ගැහුවා. නාථ දෙවියෝ භය වුණා. පසුව නාථ දෙවියො මාවැලි ගඟින් එගොඩ ගියා. සොළි කුමරු තමන් අදහන පිළිවෙළක් කල්පනා කළා. මෙහෙම හිතල කුඩා ළමයි හංගනව. හරකුන් හංගනවා. ඉතින් මිනිස්සු මේ පිටියට අරක්ගත් දෙවියන්වත් පිහිට වේදෝ කියල

හිතල පඬුරු බැන්ද. ඊට පස්සෙ තමන්ගෙ කටයුතු ඉෂ්ට වුනා. එතැන් පටන් පිටියේ දෙවියො ඇදහීමට ගත්තා. 'හාරගම' කුඹුරු යායට වතුර ගැනීමට නොහැකි වෙලා රජතුමා උදාසීන වෙලා හිටියා. ගුරුදෙණියේ ගලක් කපා කුඹුරුවලට වතුර ගෙන යාමට පිටියේ දෙවියෝ පිහිට වූ බව කියනවා. ඒකට මෙහෙම කවියක් ද තියෙනවා.

පිටියේ සුරින් දා
තෙදට තෙද දෙවියෙක් කොයින් දා
යක් සෙනග කැන් දා
දුටුද ගුරුදෙණියෙ ගල බින් දා [10]

කහටපිටියේ ශ්‍රී ධීරානන්ද හිමි, නාථ දෙවි සම්බන්ධයෙන් මෙසේ සඳහන් කර තිබේ. "සෙංකඩගල නාථ දෙවියන් පිළිබඳ ජනකථාවක් ද ඇත. ඒ අනුව මේ දෙවියා විසුවේ දුම්බර පෙදෙසේ යැ. එහි වැසියෝ පුද සැලැකුම් ලබමින් සිටින කල් හි සොළී රටින් යක් පිරිසක් හා අලුත් දෙවියන් අවුත් හුන්නස්ගිරියේ වසන්නට විය. පිට්ටනි ඇසුරු කළ මොහු මිනිසුන් භය ගන්වා ලෙඩ හදවා පුදසත්කාර ලබාගත් නිසා මිනිසුන් අතර පිටියේ දෙවි නමින් පතළ විය. නාථ දෙවියන් දැහැමි යැ. පිටියේ දෙවි සැඩ යැ. ඔහු සැඩ නිසා බිය පත් ජනයා වැඩිසැලැකිලි දැක් වූයේ ඔහුට යැ. මේ නිසා දෙදෙනා අතර යක්ගහපිටියේ දී සටනක් ඇවිළිණි. ඒ සටනින් පසු බැස ගඟින් එතෙර වැ ලිය නාතදෙවි සෙංකඩගල වාසයට පැමිණියේ යැ. ඔහු විසූ තැන නාථ දේවාලය පිහිටා තිබේ. ඉන් පසු දුම්බරට අධිපති වූ පිටියේ දෙවියන් උදෙසා අරමුණුගම දෙගල්දොරුවේ ද යක්ගහපිටිය අසළ පිලවල හා ගුරුදෙණියේ ද දේවාලය කරවා ඇත. මේවා ද ගම්පොළ යුගයට අයත් සේ ගත හැක" [11]

එංගලන්ත බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ ඇති ලාංකේය පැරණි පුස්කොළපොත් අතුරින් පිටියේ දෙවියන්ගේ කවි පොත උපුටා දක්වමින් මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා පද්‍ය අසූ පහක කවි පෙළක් සිය සිරිලක දෙවිවරු නම් කෘතියේ පළකොට තිබේ. එහි ප්‍රථම පද්‍ය සතරින් එහි කතුවරයා, ආරාධනය කළ අය, කාව්‍ය ප්‍රමාණය, ලියා නිම කළ කාලය ආදී විස්තර දැක්වෙයි. ඒ පහත එන පරිදි වේ.



එ සුරිඳු තෙද පබද
කිවියර බසින් මනනද
තුති කර කියන ලෙස
වදහළෙන් වර නරේන්ද්‍ර හිමිසඳ

පියසෙහි දොඩන් වල
කිවිසර තුමා මන කල
එතෙපුල් මන තෙපු ල
රගෙන මුඳුනත පබඳ එම කල

එ පුරදරා සොබ නය
යස තෙද විකුම් පමණය
කළ මේ කවි දැනය
එසිය හැටනවයකින් බැඳුනෙය

සකවසිනෙක් දහ ස
සසිය හතලිස් නව වස
ගුරු දින නිකිනි මස
මේ කවි පොත නිමි බව දනුව තොස [12]

උඩරට ජනශ්‍රැතියේ නාථ හා පිටියේ දෙවි සම්බන්ධයෙන් පුළුල් පර්යේෂණයක නිරත වූ ජෝන් කිලීෆර්ඩ් හෝල්ට් මෙසේ සඳහන් කර තිබේ.

"අවසන් වශයෙන් දැක්විය හැක්කේ නාථ 'ප්‍රතිස්ථාපනය' හා පිටියේ 'අනුකලනය' යන දෙක ම සිංහල සම්ප්‍රදාය සමකාලීන දේශපාලන යථාර්ථයන් කාලානුරූපව සකසා ගැනීම සමග ම

දෙවියන් දෙදෙනාගේ ම බලය සිය වාසිය සඳහා යොදා ගැනීම යි. නාථ 'ප්‍රතිස්ථාපනයෙන්' බෞද්ධයන්ගේ ආගමික චර්යාවෙහි ඒකාන්ත වැදගත්කමත් අධ්‍යාත්මික අගයත් ඇගවෙයි. පිටියේ පිළිගැනීමෙන් සිය ලෞකික කාර්යයන් සඳහා අනුකලනය කෙරෙහි සිංහල නැමියාව පෙන්නුම් කෙරෙයි. එහෙත් පිටියේගේ උරුම තහවුරු කෙරෙනුයේ එකම විමුක්ති පරිසේවනයෙහි ලා ඔහුගේ ද්විතීයික සම්බන්ධතාව ද දැක්වෙන පරිදි ය. බෞද්ධයාගේ මෙම විමුක්ති මාර්ග පරිසේවනයෙහි ලා සහභාගි වීමේ ප්‍රතිඵල වශයෙන් නායක්කර්වරුන් අතුරින් විශේෂයෙන් ශ්‍රී රාජසිංහ අතින් උඩරට බෞද්ධ සංස්කෘතියෙහි පුනරුදයක් ඇති විය. එයින් පසු සිංහලයන්ගේ ඇස් හමුවෙහි ඔවුන්ගේ රාජ්‍ය බලය ද තහවුරු විය."[13]

ජනශ්‍රැතියේ පවතින පුරාණ කතා අනුව පිටියේ දෙවියන්ගේ සම්භවය සොළී දේශයේ සිට පැමිණ දුම්බර අඩවියේ බලය පිහිටුවාගත් ආකාරයක් ගම්‍ය වේ. වසර හත්සීයක පමණ ඓතිහාසික ප්‍රවෘතියකින් කියැවෙන පිටියේ දේව සංකල්පය දුම්බර ප්‍රදේශයේ ජනප්‍රිය දේව සංකල්පයක් වශයෙන් පවතී. මේ ආශ්‍රයෙන් විවිධ පුද පූජා කරනු ලබන දේවාල රැසකි. පරිපාලනමය වශයෙන් දුම්බර කලාප කීපයකට වර්තමානයේ වෙන්ව තිබේ. එහෙත් පුරාණයේ දී දුම්බර කලාපය පුළුල් එක් ප්‍රදේශයක්ව පැවති බව විශ්වාස කෙරේ. දුම්බර ප්‍රදේශයට අධිපති හැටියට බලය පිහිටුවාගත් පිටියේ දෙවියන් වෙනුවෙන් මතු දැක්වෙන ස්ථාන වල පුරාණ දේවාල පිහිටා තිබේ. ගුරුදෙණිය, අමුණුගම, පිලවල, දම්බරාව, හුරීකඩුව, උඩුගොඩ, හපුගොඩ, යන ස්ථානයන්ය. මේවාට අමතරව අරුප්පොල, හාරගම, මාරස්සන සහ තව ද ස්ථානවල පිටියේ දේවාල පවතින බව කියැවේ. මේ දේවාලවල ඓතිහාසික සම්බන්ධතාවය විවිධ වේ. ජනශ්‍රැති හා ලිඛිත සාධක අනුව පුරාණ පිටියේ දේවාල කිහිපයක් හඳුනාගත හැකිය. ඒවා මෙසේය. ගුරුදෙණිය, පිලවල, අමුණුගම, උඩුගොඩ, හපුගොඩ, යනුවෙනි. මේ දේවාල සහ ඇතැම් පිටියේ දේවාල



සම්බන්ධයෙන් යම් යම් තොරතුරු සංග්‍රහ වී ඇතත් ඒ සියල්ලක්ම සංක්ෂිප්ත වශයෙන් දැක්වීම පමණි.

පොදුවේ බලනවිට පිටියේ දේව සංකල්පය දුම්බර සහ තදනුබද්ධ පුළුල් පරාසයක පිළිගනු ලැබ ඇති සහ පුද සත්කාර කරනු ලබන සංස්කෘතික සාධකයකි. දිවයිනේ වෙනත් ප්‍රදේශවල දක්නට නොලැබෙන පුද සිරිත් අභිචාර විදි මෙම දේවාල ආශ්‍රයෙන් පවත්වාගෙන එනු ලැබේ. මෙම දෙවියන් ඇදහීම හුදෙක් ලෞකික පරමාර්ථ සපුරාලනු වස් ක්‍රියාත්මක වේ. ඒවා අතරේ ගොවිතැන් සරු වීමටත් කෘෂි කටයුතුවල ආරක්ෂාවටත් සත්ත්ව පාලන සම්බන්ධයෙන් භාරහාර වීම් ප්‍රධාන වේ. මෙයට අමතරව ලෙඩදුක් නිවාරණය, රැකි රක්ෂා දියුණුව, සතුරු උපද්‍රව මගහරවා ගැනීම, නඩු හබ වලින් ජයගැනීම, විභාග ජය අත්පත කර ගැනීම යන කාරණා සම්බන්ධයෙන් පුදපූජා පවත්වනු ලැබේ. මෙයට අමතරව හොර මැරකම්, දූෂණ වංචා, අණ වින අධි හූනියම්, මගහරවා ගැනීම සම්බන්ධයෙන් යම් යම් අභිචාර විධි ඇතැම් දේවාල ආශ්‍රයෙන් බැතිමතුන් වෙනුවෙන් සිදු කෙරේ. ඒවා අතරේ පඬුරු බැඳීම, පඬුරු කැපීම, යැදීම, පළි ගැසීම, ආදිය රහස්‍ය ගුරුකම් අතරට අයත් වේ.

පිටියේ දේවාලවල වාර්ෂිකව අලුත් සහල් මංගල්‍යය පවත්වනු ලබන්නේ පුරාණ චාරිත්‍ර අඛණ්ඩව පවත්වාගෙන ඒමේ අභිලාශයෙනි. ඇතැම් දේවාලවල පුරාණ සිරිත් අනුව මේ මංගල්‍යය සිදුකෙරෙන අතර සමහර ස්ථානයන්හි නවාංග එකතු වී තිබේ. ලබන්නා වූ නව වසර සඳහා සශ්‍රීකත්වය හා ආශිර්වාද ලබා ගැනීම වෙනුවෙන් මෙම මංගල්‍යය පැවැත්වීම සිදුවේ. ඒ ඒ දේවාල ආශ්‍රයෙන් සම විසම සංස්කෘතික ලක්ෂණ දැකිය හැකි අතර සමහර දේවාල කෙරෙන් පුරාණ චාරිත්‍ර විධි අභාවයට යාමේ ලක්ෂණයක් ද පවතී. පිටියේ දේව සංකල්පය ආශ්‍රයෙන් භෞතික වශයෙන් පුළුල් කලාපයක අධ්‍යයනයක් සිදුකිරීම මෙතෙක් ආරම්භ වී නැත. දේවාල ආශ්‍රිතව පවතින්නාවූ භෞතික සංස්කෘතික ලක්ෂණ සහ ජනශ්‍රැති සාධක මෙන්ම ජන සමාජයේ

ඇති ජන සාහිත්‍යය අදාළ පර්යේෂණය සඳහා ප්‍රධාන මූලාශ්‍රය කර ගැනීමට පුලුවන. මෙම පිටියේ දේව සංකල්පය ආශ්‍රයෙන් තිබෙන්නා වූ පුරාණෝක්ති සහ අභිචාර විධි විශලේෂණාත්මකව අධ්‍යයනය කිරීම තුළින් ආගමිකවූත් සංස්කෘතිකවූත් සමාජීයවූත් නව අර්ථකථන ඉදිරිපත් කිරීම බලාපොරොත්තු විය හැකිය. එයින් දිවයිනේ එක්තරා කලාපයකට පමණක් සීමා වූ ප්‍රාදේශීය දේව විශ්වාසයක් පිළිබඳ බොහෝ කරුණු අනාවරණය කරගත හැකිය.


## අන්ත සටහන්


1. වජිරඥාණ හිමි, ගුන්නෑපාන .- (1960) විහාර වග විත්ති ; ගුණසේන, කොළඹ : පිටු 1-4.
2. වාචිස්සර හිමි, කොටගම.- (1960) සරණඞකර සඞඝරාජ සමය ; දොන් ඇඩ්වින් සහ සමාගම, කොළඹ : පිටු 93-94
3. තෙන්නකෝන් , විමලානන්ද .- (1963) උඩරට මහ කැරැල්ල ; ගුණසේන , කොළඹ : පිටු 344-345
4. ධම්මානන්ද, නාවුල්ලේ .- (1969) මධ්‍යම ලංකා පුරාවෘත්ත ; ගුණසේන , කොළඹ : පිටු 37-38
5. ධර්මදාස, කේ. එන්. ඕ. සහ තුන්දෙණියේ එච්. එම්. එස් .- (1994) සිංහල දේව පුරාණය ; රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව , කොළඹ : පිටු . 303-307
6. ඩේවි දුටු ලංකාව (1967) , අනුවාදක ඇල්ලේපොල එච්. එම්. සෝමරත්න. සංස්කාරක ආචාර්ය විමලානන්ද තෙන්නකෝන් .- කොළඹ : ගුණසේන, පිටුව 101.
7. වික්‍රමසිංහ, ඩී. පී. .- (1998) මග දිගට ජනකතා ; සූරිය ප්‍රකාශකයෝ , කොළඹ : අප්‍රේල්. පිටු. 111
8. සෙනෙවිරත්න, නි. බ. මා. .- (1989) සිංහල කාව්‍ය සංග්‍රහය මාතර යුගය ; රජයේ මුද්‍රණාලය , කොළඹ : (නැවත මුද්‍රණය) පිටු 221-231.






9. පෙරේරා, ජී. එස්. .- (2003) දේවවිත්ති සහිත කෝල්මුර කවි; කොළඹ : වේඩර්ග් ,
10. වීරසේකර, තිස්ස .- (1997) සිංහල ජනශ්‍රැතිවලින් නිරූපිත අපේ සංස්කෘතිය ; කොළඹ : ගුණසේන , පිටු. 95-96.
11. ධීරානන්ද හිමි, කහටපිටියේ .- (1965) ගම්පොළ යුගය ; කොළඹ : ගුණසේන , 1965. පිටු. 203-204.
12. කාරියවසම්, තිස්ස.- (1991) සිරිලක දෙවිවරු ; තරංජි ප්‍රින්ටස්, දෙහිවල , පිටු. 168-176.
13. ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට්, පරි. පී. බී. මීගස්කුඹුර.-මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය ; ප්‍රදීප ප්‍රකාශකයෝ , කොළඹ : 1994. පිටු 197-198.

යක්ගහපිටියේ පිටියේ දේවාලයේ පැති පෙනුම



යක්ගහපිටියේ පිටියේ දේවාලයේ පැරණි වී කොටන ඔරුව
(මෙ බඳු ඔරු දෙකක් හපුගොඩ පිටියේ දේවාලයේ ද ඇත).